# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 6 ශ්‍රේණිය | එදිනෙදා ජීවිතයේ දී ශක්තිය | ඒකකය - 04 |
| --- | --- | --- |

✦ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) මිනිසාට ශක්තිය ලබාදෙන මූලික ප්‍රභවය වන්නේ,
1) සුළඟ 2) න්‍යෂ්ටික ශක්තිය 3) සූර්යයා 4) ජලය

02) ශක්තිය යනු,
1) බලයයි 2) කාර්යයයි 3) චලනය කිරීමයි 4) කාර්ය කිරීමේ හැකියාවයි

03) පහත ඒවා අතරින් ශක්ති ප්‍රභවයක් නොවන්නේ,
1) ජෛව ස්කන්ධ 2) උෂ්ණත්වය 3) ඉන්ධන 4) ෆොසිල ඉන්ධන

04) දහනයේ දී තාපය ලබා දෙන්නේ පහත සඳහන් කුමන ශක්ති ප්‍රභවය ද?
1) සූර්යයා 2) ඉන්ධන 3) සුළඟ 4) විදුලිය

05) අප භාවිතා කරන ප්‍රධාන ජෛව ස්කන්ධ වන්නේ,
1) සුළඟ 2) සූර්ය තාපය 3) දර 4) ලී කුඩු

06) චන්ද්‍රයාගේ හා සූර්යයාගේ බලපෑම නිසා සාගරයේ ජල මට්ටම වරින් වර වෙනස් වේ. මෙම එක් එක් අවස්ථාවලදී,
1) විදුලිය නිපදවිය හැකිය. 2) භූ තාපය නිපැදවිය හැකිය.
3) ජීව වායුව නිපදවිය හැකිය. 4) න්‍යෂ්ටික බලය නිපදවිය හැකිය.

07) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති සුළං විදුලි බලාගාර 02 ක් වන්නේ,
1) පුත්තලම හා යාපනය 2) ගාල්ල හා මාතර
3) පුත්තලම හා හම්බන්තොට 4) හම්බන්තොට හා ගාල්ල

08) ගල් අඟුරු, පෙට්‍රෝලියම් තෙල් වර්ග, පෙට්‍රෝලියම් වායු ආදී සියල්ල ම,
1) ජෛව ඉන්ධන වේ. 2) න්‍යෂ්ටික ඉන්ධන වේ.
3) ජෛව ස්කන්ධ වේ. 4) ෆොසිල ඉන්ධන වේ.

09) පරිසර දූෂණය වැඩියෙන්ම සිදුවන්නේ පහත සඳහන් කුමන ක්‍රමයට විදුලිය නිපදවා ගැනීමේ දී ද?
1) ඉන්ධන දහනයෙන් 2) සූර්ය ශක්තියෙන්
3) සුළඟේ ශක්තියෙන් 4) ගලායන ජලයේ ශක්තියෙන්

10) නිවැරදි පිළිතුර තෝරන්න.
1) ජනගහනය වැඩි වන විට ශක්ති ප්‍රභව වැඩි වේ.
2) ශක්ති ප්‍රභව අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතු නැත.
3) සූර්ය ශක්තිය අවසාන වෙමින් පවතී.
4) ශක්ති පරිභෝජනය අඩු කිරීම තුළින් අනාගත පරපුරට ශක්තිය ඉතිරි කර ගත හැක. (ල. 10)

## B කොටස - රචනා

✦ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01) ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ ප්‍රදීප්ගේ නිවසට විදුලිය ලැබී ඇත. නිවසට ආලෝකය ලබා ගැනීමට භූමිතෙල් භාවිත කළ ඔවුහු දැන් විදුලය භාවිතා කරති. එහෙත් ආහාර පිළියෙල කර ගැනීමට අවශ්‍ය තාපය ලබා ගැනීමට තවමත් යොදා ගන්නේ දරය.

i. ඉහත ඡේදයේ සඳහන් කරුණු අනුව

අ) ශක්ති වර්ග 02 ක් නම් කරන්න. (ල. 02)

.................................................. ..................................................

ආ) ශක්ති ප්‍රභව 02 ක් නම් කරන්න. (ල. 02)

.................................................. ..................................................

ii. විදුලිය නිපදවීමට යොදා ගත හැකි ශක්ති ප්‍රභව 02 ක් නම් කරන්න. (ල. 02)

.................................................. ..................................................

iii. අප රටේ පිහිටි ජල විදුලි බලාගාරයක් නම් කරන්න. (ල. 02)

..................................................................................................................

iv. අතීතයේ දී ජලයේ අඩංගු ශක්තිය යොදා ගත් අවස්ථා 02 ක් සඳහන් කරන්න. (ල. 02)

..................................................................................................................................................

..................................................................................................................................................

(02) i. ෆොසිල ඉන්ධන යනු මොනවාද?

..........................................................................................................................................................

.................................................................................................................................... (ල. 02)

ii. ඔබ දන්නා ෆොසිල ඉන්ධන 04 ක් නම් කරන්න.

........................................................ ........................................................

........................................................ ........................................................ (ල. 02)

iii. බොහෝ ශක්ති ප්‍රභවවල මූලික ප්‍රභවය වන්නේ කුමක් ද?

................................................................................................................................... (ල. 02)

iv. ඉන්ධන භාවිතා කර විදුලිය නිපදවනවාට වඩා සුළඟේ ශක්තිය මඟින් විදුලිය නිපදවීම වාසිදායක වන්නේ ඇයි?

.................................................................................................................................... (ල. 02)

v. ෆොසිල ඉන්ධන සෑදෙන්නේ කෙසේද?

.................................................................................................................................. (ල. 02)

(03) පහත දැක්වෙන අවස්ථාවල දී භාවිතා කරන ශක්ති ප්‍රභවය කුමක්දැයි ඉදිරියෙන් ලියන්න.

| ශක්තිය ලබා ගැනීමට භාවිතා කරන අවස්ථාව | ශක්ති ප්‍රභවය |
|---|---|
| i) කුඩු ලිප දැල්වීම. | ........................................................... |
| ii) වැන් රථය ගමන් කිරීම. | ........................................................... |
| iii) ජල විදුලි බලාගාරයක විදුලිය නිපදවීම. | ........................................................... |
| iv) ධාන්‍ය වේලා ගැනීම. | ........................................................... |
| v) වී වල ඇති බොල් වී ඉවත් කිරීම. | ........................................................... |
| vi) සාගර ජල මට්ටමේ වෙනස අනුව විදුලිය නිපදවීම. | ........................................................... |
| vii) පොළොව යට ඇති තාපය මඟින් විදුලිය ලබා ගැනීම. | ........................................................... |
| viii) පරමාණුවලින් ශක්තිය ලබාගෙන විදුලිය නිපදවීම. | ........................................................... |
| ix) ආහාර පිසීම. | ........................................................... |
| x) ජලය රත් කිරීම. | ........................................................... |

(ල. 10)

04) එදිනෙදා ජීවිතයේ දී සිදු කරනු ලබන සෑම කාර්යයක් සඳහාම ශක්තිය අවශ්‍ය වේ.

i) ශක්තිය යනු කුමක්ද?

................................................................................................................................... (ල. 02)

ii) සුළං පෙත්ත කරකැවීමේ දී එයට ශක්තිය ලැබුණේ කෙසේ ද?

.................................................................................................................................. (ල. 02)

iii) අතීතයේ දී සුළඟේ ශක්තිය යොදා ගත් අවස්ථා 02 ක් සඳහන් කරන්න.

.................................................................................................................................. (ල. 02)

iv) ඔබට ජල ටර්බයිනයක් සෑදීමේ දී පෙති සඳහා යොදා ගත හැකි ද්‍රව්‍යයක් ලියන්න.

.................................................................................................................................. (ල. 02)

v) ශිෂ්‍යයෙක් විසින් සාදන ලද මෙවැනි ජල රෝදයක් මතින් ජලය පහළට ගලා ගියද ජල රෝදය කැරකුනේ නැත. මෙයට හේතු වී යැයි ඔබ සිතන කරුණක් ලියන්න.

.............................................................................................................................. (ල. 02)